මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\12

2023.01.13

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් - 2023

**බලයලත් නියෝජිතයන් පත් කිරීම.**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 89 වගන්තිය අනුව බලයලත් නියෝජිතයන් පත්කිරීම නාමයෝජනා කිරීමේ කාල සීමාව ආරම්භ වීමට යටත් පිරිසෙයින් පැය හැත්තෑ දෙකකට පෙර සිදු කළ යුතු ය. එබැවින්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023 සඳහා බලයලත් නියෝජිතයන් පත් කිරීම 2023.01.15 දින පෙ.ව. 8.30 ට ප්‍රථමයෙන් සිදු කළ යුතු ය.

මේ පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී අනාවරණය වූයේ ඔබ පක්ෂයට අදාළ බලයලත් නියෝජිතයන් පත් කිරීම ඒ ඒ සභාවේ තේරීම්භාර නිලධාරීන් වෙත ඉහත සඳහන් කළ කාල සීමාවට ප්‍රථමව ලබාදීම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයක් වන බවයි. එබැවින් බලයලත් නියෝජිතයන් පත්කිරීමේ ලිපි නියමිත කාල සීමාවේ දී අදාළ තේරීම්භාර නිලධාරියා වෙත ලබාදීමට ක්‍රියා කරනු ලබන ලෙස දැනුම් දී සිටින අතර මේ සඳහා සුදුසු කඩිනම් තැපැල් බෙදාහැරීමේ ක්‍රමයක් භාවිතා කරන්නේ නම් මැනවි.

එසේම තේරීම්භාර නිලධාරි වෙත යවනු ලබන ලිපිවල පිටපත් පමණක් මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය වෙත ලබාදිය හැකි බව ද වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

නිමල් ජී. පුංචිහේවා

**නිමල් ජී. පුංචිහේවා**
සභාපති
මැතිවරණ කොමිෂන් සභාව